# මහ වැස්ස



බී.ඒ. තිසෙනි ඔනාදී බණ්ඩාර

# මහ වැස්ස

බී.ඒ. තිසෙනි ඔනාදී බණ්ඩාර

**මහ වැස්ස**

කතෘ ප්‍රකාශනයකි

පළවන මුද්‍රණය 2026 .......

කතාව සහ චිත්‍ර

**බී.ඒ. තිසෙදි ඔනාදී බණ්ඩාර**

7. ශ්‍රේණිය C

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

ISBN 978-624-208-920-1

# පිදුම

මිණිකැට මෙන් මුතු අකුරු
එකිනෙක
පද බැඳ
සිප් සතර මුල පුරන්නට
දිරිය දුන්
මාගේ ක්‍රිෂාන්ති
ගුරු මෑණියන්ට ද
නිතැතින් මාගේ සෙවනැල්ල
මෙන්
හිඳිමින් සියලු කාර්යන්ට
ශක්තියක් වන
මාගේ මවට, පියාට පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාර ධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධණය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුහවතුන් ඇතුලු සැමට ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලිත්වය හා බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනිය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්,<br>
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.<br>
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.<br>
2026.05.10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළිදැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව,
2026.05.10

දින සති මාස ගනන් ගත විය. එහෙත් ජීවිතය පුරාවටම අමතක නොකල හැකි කොතරම් දෑ අප සිත්වල රැඳී පවතින්නේ ද?. සිහියට නැගෙන වාර ගනන් නිමක් නැත. මේ දුක්බර කතාව මා ඔබට කියන්නම්. එදින සවස අප නිවසේ අම්මාත් නංගිලා දෙන්නාත් පන්සල් ගියා. බුදුන් වැඳ මල් පූජා කලා. පසුව අම්මා මටත් නංගිලා දෙදෙනාටත් රාත්‍රී ආහර බෙදා දුන්නා. අපි ඉතා සතුටින් නිදාගන්න ගියේ හෙට දින උදයේ පාසල් පොත් බෑගයක් සූදානම්කර තැබීමෙන් පසුවය. හෙට දින පාසලේ ආරම්භ වන්නේ වාර විභාගය යි.  නංගිලා දෙදෙනාත් මාත් අම්මා සමඟ ටික වේලාවක් කතා කලේ ඒ අධ්‍යාපනයේ දැඩි දක්‍ෂතාවක් වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නට ඇති බලාපොරොත්තුව ගැනයි. මා තවමත් අටවන පංතියේ සිටින අතර නංගිලා දෙදෙනා පහළ ශ්‍රේණි වල ඉගෙනුම ලබයි. හෙට උදයේ පාසල් යාමට ඇඳුම් පාවහන්, පොත් බෑගය සියල්ල සූදානම්ය.



මා වෙනත් කාමරයක ද, අම්මා සහ නංගිලා යාබද කාමයේත් නිදා  ගතිමු. තද නින්දේම මැදියම් රැය ගත වූවත් ක්‍ෂණයකින් අවධි වූ මට සිදු වී ඇතිදෙය සිතා ගත නොහැකි විය.

දෙවියනේ මහා විශාල වරුසාවක්, භයංකර ශබ්දයක් මොහොතින් මොහොත බුර බුරා එන බියකරු බවින් මඳකට සිහිය පවා වියරු විය. තවත් නිමේෂයකින් වූයේ ගෙය මතට විශාල ගසක් කඩා වැටීමයි.



මේ සිදුවන්නේ කුමක් ද? ජීවිතයේ කිසිදාක නොවූ විරූ භයංකාර සිද්ධිවල අගක් මුලක් තේරුනේ නැත. කෙසේ නමුත් ඇඟපතට දැනුන දැඩි සීතලත් අන්ධකතාරයත් භයානක ඝෝෂාවත් අතරේ මා මුව පොව්වෙකු මෙන් විය. ජීවිතය රැක ගන්නට සැඟවෙන්නේ කෙසේද?

අඳුරේම දැනුනේ නිවස කැඩී යමින් පවතින බවයි. අහෝ දෙවියනේ ගෙය මතට වැටී ඇති මහ විශාල ගසේ අත්තකට නැග ගැනීමට තරම් හැකියාව ලැබුනේ කෙසේද?.

මහ වරුසාවේ අඳුරේම ගෙය මතට ඇද වැටුන් ගසේ අත්තක් අල්ලාගත් මම එයට නැගී රැය පහන් වන තුරුම රැඳී සිටියෙමි. "දැන් ඇත්තේ පණ රැක ගැනීම පමණයි" ඉතා ගැඹුරින් මට සිහියට නැගේ.

ටිකෙන් ටික අඳුර තුනී වන්නට විය. වැස්ස නම් ඒ විදියමයි. සීතල දරා ගන්නේ කෙසේද? නමුත් ගසේ අත්ත අත හැරී ගියහොත් සිදුවන ඉරණම කුමක් ද? බියකරු බව කොතරම්ද ඒ හා සමානවම ධෛර්යය සිතට දැනෙන්නට විය.

යාන්තමින් එළිය වැටෙන්නට විය . පසු දිනට ඉර පායයි ද? මද එළියෙන් මා දුටුවේ මැදියම් රැයේ සිදුවූ විනාශයයි. කියන්නේ කා හට ද? ගතවූ රැවේ කා බී නිදාගත් නිවසට කුමක් වී ද? අම්මාත් නැගණියන් දෙදෙනාත් සිටින්නේ කොහේ ද? ඔවුන් ගැන විමසන්නේ කාගෙන්ද? ඒ ගැන දන්නේ දෙවියන් පමණක් නොවේ ද?.

ගන අන්ධකාරය නිමා වී පසුදින උදාවුණා. තවමත් මා පෙරලී ඇති විශාල ගසේ අත්තක වවුලකු මෙනි. විඳගන්නට නොහැකි තරම් ශීතල ද වැස්සේ ද අවසානයක් නොමැත.

මම "අම්මේ" කියා හැඩුවෙමි. "නංගී" කියා කෑ ගැසුවෙමි. අහල පහල අයට හඬගෑවෙමි. සියලු දෙනා නිසොල්මනේ ය. පිළිතුරක් දෙන්නට කිසිවෙකු පෙනෙන්නට නැත. ඇත්තේ ඝෝර ගලන ජල කඳ පමණි.



අපි මේ කුමන දුකකට පත් වුනා ද? ගත වූ මේ වයසට ඇස පිරූ දෙයක් ද සිතා ගන්නට නොහැකි තරම් ය. අපේ රටට ම මෙවැනි දෙයක් වුවාද? අපට පමණද මේ දුක . මා නොයෙක් දෙය කල්පනා කලෙමි. සිදුවී ඇති සියල්ලම දරාගත නොහැකි විය. කෙමෙන් කෙමෙන් දිවා කාලය යන්තම් හිරු හළිය පැවතුනත් තවම ඇත්තේ වර්ෂාව පමණි. ගසේ අත්තක් උඩ සිටින මා හට සියලු වට පිටාව දිස්වුණි. විශාල පස් කඳු කඩා වැටී තිබුණි. අපගේ නිවසේ ද කිසිවක් ඉතිරිව නොතිබුනි. අම්මාත් නංගිලා දෙදෙනාත් මේ ජල ධාරාවට හසුවන්නට ඇතැයි මට හැඟේ.

නිවස තුල තිබු සියලු බඩු බාහිරාදිය අපගේ පොත්පත් කිසිවක් පෙනෙන්නට නැත. සිදුවූයේ කුමක්දැයි තවම මා හට සිතා ගත නොහැක. මේ ලෝකේ මා තනි වූවාද? මා පමණක් සිටින්නේ කුමකට ද? මට ද මේ ජල ධාරාවට පැන මැරී යන්නට ද සිතේ. මෙතැන් සිට මා හට සිදුවන්නේ කුමක් ද? මා හට කාගේ හවිහරනක් ද?.


රැය පුරා සිදුවූ විනාශයත්, සීතලත් අම්මලා නංගිලා නොමැති දුකත් විඳ දරා ගන්නේ කෙසේද? දැන් දැන් කුසගින්න ද දැනේ. එහෙත් කිසිවක් කර කියා ගත නොහැක. ගසේ අත්ත අත හැරුණ හොත් කුමකින් කුමක් සිදුවේද?

දිවා කාලය උදාවත්ම හෙලිකොප්ටර් යානාවක් අහසේ එහා මෙහා යනු පෙනේ. මුලු ගමම නිසල වූවත් පාරක් තොටක් සොයා ගත නොහැක. ඉතා දුරින් කවුරුන් හෝ එනු පෙනේ. ඒ දුටු මා යාන්තමින් ප්‍රාණවත් වූයෙමි. පුළුවන් තරම් වේගයෙන් කෑ ගැසුවෙමි. මා බේරා ගන්නා ලෙසට ශබ්ද නගා කියමින් හඬන්නට පටන් ගත්තෙමි.




තවත් පැයක් පමණ ගතවිය. මා සිටින තැනට ලඟා වන්නට ඉතා අපහසු බව මා තේරුම් ගෙන සිටියෙමි. එහෙත් කවුරුන්හෝ දෙදෙනෙකු මා දෙසට එනු පෙනේ. ඒ දෙවියන් වහන්සේලා යැයි මට සිතතුනි.

කෙසේ හෝ මේ දෙදෙනා ඉතා අපහසුවෙන් මා සිටි දෙසට පැමිණෙමින් සිටී. බිය නොවන ලෙසත් ප්‍රවේසම්ව සිටින ලෙසත් ඔවුන් කෑ ගසා කියන්නට විය. සෝදා පාලුවට හසු නොවන පස් කන්ඩියක් දෙසින් පැමිණ ඉතා සීරුවාරුවට පෙරලුනු ගසට නැග මා බේරාගත්තේ මෙම දෙවියන් වැනි වූ දෙදෙනා ය.



ඔවුන් මා කඳවුරකට රැගෙන ගියා. එතැන ද මා වැනි අසරණ වූවන් බොහෝ විය. සීතල ඇඳුම් ඉවත් කර ඇඳගැනීමට අලුත් ඇඳුමක් ලැබුණි. උණුසුම් ආහාර ද ලැබුණි. එහෙත් සිදුවූ දෙය කීමට තරම් හැකියාවක් වත් මට නොවීය. ගේ දොර සියල්ලම අහිමිව ඇඳිවත පමණක් ඉතිරිව අන්ත අසරණ වූවන් මෙතැන පිරී පිරී ඇත. අන් සියලු දෙනා ආගිය අතක් නැත. ගල් පස් වලට යට වන්නට ඇත. ඉතා වේගයෙන් ගලා ගිය බොර වතුරට හසුවන්නට ද ඇත. මොන තරම් දුකක් වේද මෙය. සියලු දෙනා හැඬූ කඳුලින් සිටිනු මට පෙනේ.



අනාථයන් ලෙස මෙතැන කොතරම්කාලයක්  සිටින්නට වේද? කෑම, බීම, ඇඳුම් ලැබෙන්නේ කෙසේද?. පාසල් යන්නට ලැබේවිද?. පොත්පත් කොහින් ද? මේදුක් කන්දරාවක් ගැන සිතිමින් මම දුක් වූයෙමි. දිනක් ගත විය. පසුදා උදෑසන පන්සලේ ලොකු ස්වාමීන් වහන්සේ මෙතන වඩිනු පෙනේ. ඒ සමඟ බොහෝ පිරිසක් ද අපගේ දුක සැප බැලීමට පසුපසින් එනු පෙනේ.

සියලු දෙනාම හැකි සෑම අයුරකින්ම අපට ආහාරපාන බිස්කට් වර්ග, ඇඳුම්, බෙදා දෙන්ට විය.

ඒ සමගම පොලිසියට අයත් ජීප් රථයක් පැමිණි අතර එයින් කිහිප දෙනෙකු බසින අයුරු මට දිස්විය. අදාහාගත නොහැකි දෙයක් වූ වත් ඒ පිරිස අතර මගේ අම්මා ද නංගිලා දෙදෙනාද සිටිනු දැකීම මාගේ සතුටු කඳුලු  ගලා ඒමට හේතු විය. මා එක හෙලාම දුව ගොස් ඔවුන් ලඟට විය. මහා වේගයෙන් අම්මා තුරුලු කරගෙන හැඬීමි. මුළු ලෝකයම නැති වුවත් අම්මා මට හයියක් වන බව මගේ සිතට දැඩිව ශක්තියක් විය.

අලුයම 5 වන විට ඔරලෝසුවේ කනිසම ඉතා වේගයෙන් නාද වූයේ සුපුරුදු ලෙසින් පාසල් යාමට අවදි කරමින් කෑ ගසන අම්මාගේ නාදයත් නංගිලාගේ ශබ්දයත් සමගිනි.

මෙසා විශාල සිහිනයක මුලු රැයක් අතරමං වූ මම අම්මාට සිදුවූ දෙය කියා දුන්නේ ද හඬමිනි.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ගා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධණය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **හේමමාලා උපහාර** ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාර ධර්ම නිපුණතා සංවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද දියවඩන නිලමෙතුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් උපහාර දක්වමු.

සෙනෙවිරත්න මහලේකම්